අද. 2024. 10. 18 පිටු 2

උපත් අඩුවෙයි

# මරණ වැඩිවෙයි

**වසර 5ක් තුළ ලියාපදිංචි දරු උපත් 71,110කින් අඩුවී මරණ 34,842කින් වැඩිවෙයි**




**මොහොමඩ් ආසික්**

ශ්‍රී ලංකාවේ 2019 සහ 2023 අතර වසර පහක කාලයෙහි ලියාපදිංචි දරු උපත් සංඛ්‍යාව 71,110 කින් අඩු වී මරණ ලියාපදිංචිය 34,842 කින් ඉහළ ගොස් ඇති බව රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව පවසයි.

2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත අනුව 2019 වසරේ සිට 2023 වසර දක්වා ශ්‍රී ලංකාවෙහි සිදුව ඇති දරු උපත් සහ මරණ සම්බන්ධයෙන් කරන ලද තොරතුරු ඉල්ලීමකට ලැබුණු තොරතුරු අනුව මේ බව සඳහන් වෙයි.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ තොරතුරු නිලධාරි ඒ.එම්.ආර්.එස්.කේ. අමරකෝන් මහතා විසින් ලබා දී ඇති තොරතුරු අනුව 2019 වසරේදී ශ්‍රී ලංකාවෙහි දරු උපත් 319,010 ක් සිදුව ඇති අතර 2020 වසරේදී උපත් 301,706 ක් සිදුව තිබේ. ඒ අනුව එම වසරෙහි පෙර වසරට සාපේක්ෂව දරු උපත් 17,304 ක අඩුවක් පෙන්වයි. 2021 වසරේදී උපත් 284,848 ක් වාර්තා වී ඇත.එය පෙර වසරට සාපේක්ෂව එය උපත් 16,858 ක අඩු වීමක් වෙයි. 2022 වසරේදී දරු උපත් 275,321 ක් සිදුව ඇත.එය පෙර වසරට සාපේක්ෂව උපත් 9,527 ක අඩු වීමකි. 2023 වසරේදී දරු උපත් 247,900 ක් ලියාපදිංචි කර තිබේ. එය පෙර වසරට සාපේක්ෂව උපත් 27,421 ක අඩු වීමක් වෙයි.

2019 වසරේ සිට 2023 වසර දක්වා වූ වසර පහක කාලයෙහි ලංකාවේ ලියාපදිංචි කර ඇති දරු උපත් සංඛ්‍යාව 71,110 කින් අඩු වී තිබේ.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව මගින් ලබා දී ඇති තොරතුරුවලට අනුව 2019 වසරේදී ලියාපදිංචි කර ඇති මරණ සංඛ්‍යාව 146,397 කි. 2020 වසරේදී එය1,32,431 ක් වෙයි. ඒ අනුව එම වසරෙහි මරණ 13,966 ක අඩුවක් පෙන්වයි. 2021 වසරේදී මරණ 1,63,936 ක් ලියාපදිංචි වී තිබේ. එම වසරෙහි මරණ සංඛ්‍යාව 31,505 කින් ඉහළ ගොස් තිබේ. 2022 වසරේදී මරණ 1,79,792 ක් ලියාපදිංචි වී ඇති අතර පෙර වසරට සාපේක්ෂව මරණ 15,856ක වැඩි වීමක් පෙන්නුම් කරයි. 2023 වසරේදී මරණ 1,81,239 ක් ලියාපදිංචි වී ඇති අතර එය පෙර වසරට සාපේක්ෂව 1,447 ක වැඩි වීමකි.

කෙසේ නමුත් මෙම සංඛ්‍යා ලේඛන අනුව 2021 සහ 2022 වසරවල මරණ සංඛ්‍යාවේ අසාමාන්‍ය වැඩි වීමක් පෙන්නුම් කරන්නේ එම කාලයෙහි සිදු වූ කොවිඩ් 19 ආසාදිත මරණ නිසා විය හැකියි. එම වැඩි වීම 2023 වසරේ සිට අඩු වෙමින් පවතින බවද සංඛ්‍යා ලේඛනවල දැක්වෙයි .